සැ. යු. - 2012.09.21 දින පළවූ අංක 1777 දරන ගැසට් පත්‍රයේ IV(අ) කොටස පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ V කොටසේ 2009 වර්ෂයේ ජූලි - සැප්තැම්බර් කාර්තුවට අදාළව මුද්‍රණ ශිල්පීන්ගේ හා ප්‍රකාශකයින්ගේ ආඥාපනත යටතේ ලියාපදිංචි වූ පොත් නාමාවලියක් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් පළවේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,778 - 2012 සැප්තැම්බර් 28 වැනි සිකුරාදා - 2012.09.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී.)

## IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1468 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1478 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | — |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2012 ඔක්තෝබර් මස 19 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2012 ඔක්තෝබර් මස 05 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**බී. කේ. එස්. රවීන්ද්‍ර,**
රජයේ මුද්‍රණාලයාධිපති. *(වැ.බ.)*

2012 ජූනි මස 23 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

# තනතුරු - ඇබෑර්තු

## බළපිටිය ප්‍රාදේශීය සභාව

බළපිටිය ප්‍රාදේශීය සභාවේ මාර්ග කම්කරු තනතුරු පුරප්පාඩුව සඳහා බඳවා ගැනීම

බළපිටිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුව පවතින මාර්ග කම්කරු තනතුර පිරවීම සඳහා පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති දකුණු පළාත තුළ පදිංචි ස්ත්‍රී/පුරුෂ දෙපාර්ශ්වයෙන්ම අයදුම්පත් කැඳවනු ලැබේ.

01. *වැටුප් ක්‍රමය* :- PL1-2006-A 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600

02. *වයස් සීමාව* :- අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය.
(දැනටමත් රාජ්‍ය සේවයේ/පළාත් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.)
මෙම අය අදාල දෙපාර්තමේන්තුවේ ප්‍රධානියා මගින් තම අයදුම්පත්‍ර ඉදිරිපත් කළ යුතුය.

03. *අධ්‍යාපන සුදුසුකම්* :- අධ්‍යාපන අධ්‍යක්ෂ ජනරාල් විසින් අනුමත පාසලකින් අවම වශයෙන් 5 වන ශ්‍රේණිය සමත් වී සිටිය යුතුය.

04. *බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි* :-

(i) අයදුම්කරු ශ්‍රී ලංකා පුරවැසියෙකු විය යුතුය.
(ii) අයදුම්කරු දකුණු පළාත තුළ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය.
(iii) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් සිටිය යුතුය.
(iv) බළපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට සේවයේ නියුතු තාවකාලික/අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.

05. *බඳවා ගන්නා ක්‍රමය* :

විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් බඳවා ගනු ලැබේ.

06. *සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි* :

(i) මෙම තනතුර ස්ථිරය, විශ්‍රාම වැටුප් සහිතය,
(ii) පත්වීම වසර 03 ක පරිවාස කාලයකට යටත් වේ.

07. සේවා කොන්දේසි :- ආයතන සංග්‍රහයේ රෙගුලාසි වලටද, මුදල් රෙගුලාසි වලටද, දෙපාර්තමේන්තු නියෝග වලටද, දකුණු පළාත් සභාවේ හෝ බළපිටිය ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

08. අයදුම් කළ යුතු ආකාරය :- මෙම නිවේදනයේ සඳහන් ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරගන්නා අයදුම්පත් 2012.09.30 වැනි දිනට පෙර "සභාපති, බළපිටිය ප්‍රාදේශීය සභාව, බළපිටිය" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත බහාලන ලියුම් කවරයේ වම්පස ඉහළ කෙළවර - "මාර්ග කම්කරු තනතුර සඳහා අයදුම්පත" යනුවෙන් සඳහන් කළ යුතුය.

ජී. දයාරත්න ද සිල්වා,
සභාපති,
බළපිටිය ප්‍රාදේශීය සභාව.

### ආදර්ශ අයදුම්පත

*දකුණු පළාත් රාජ්‍ය සේවයේ බළපිටිය ප්‍රාදේශීය සභාවේ ........................................................................................ තනතුර සඳහා අයදුම්පත*

01. (i) මුලකුරු සමග නම :————————,
(ii) මුලකුරු වලින් හැඳින්වෙන නම්:————————,
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————,
03. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :————————,
04. ස්ථිර ලිපිනය :————————,
05. ජාතික හැඳුනුම්පත් අංකය :————————,
06. ස්ත්‍රී/පුරුෂ භාවය :————————,
07. උපන් දිනය : වර්ෂය :————————, මාසය :————————, දිනය :————————,
08. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :————————, මාස :————————, දින :————————,
09. ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු වන්නේ පරම්පරාවෙන් ද/ලියාපදිංචි වීමෙන් ද? :————————,

10. අධ්‍යාපන සුදුසුකම් (සමත්වූ විභාග පිළිබඳ විස්තර) (සහතික වල පිටපත් අමුණන්න) :
 ________________,
 ________________,
 ________________,
 ________________,

11. ඉල්ලුම්කරු දැනට රැකියාවක නියුතු නම්, :————————,
 (i). තනතුර :————————,
 (ii). සේවය කරන ස්ථානය :————————,
 (iii). පත්වීම් දිනය :————————,

12. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ?, :————————,

13. *අයදුම්කරුගේ සහතිකය* :- මෙම අයදුම්පතේ ම විසින් සඳහන් කර ඇති තොරතුරු සත්‍ය හා නිවැරදි බවත්, මෙහි ඇතුළත් තොරතුරු වලින් කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මම තෝරාගැනීමට පෙර අනාවරණය වුවහොත් මිගේ අයදුම්පත අවලංගු වීමට යටත් වන බවත්, තෝරා ගැනීමෙන් පසු අනාවරණය වුවහොත් කිසිම වන්දියක් නොමැතිව සේවයෙන් පහ කිරීමට යටත් වන බවත්, මම දනිමි.

________________,
අයදුම්කරුගේ අත්සන.

දිනය:————————,

11. *රාජ්‍ය හා පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා පමණි.*

මෙම අයදුම්කරු දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ සේවයේ නියුක්ත බවද, ඔහුගේ/ඇයගේ වැඩ හා හැසිරීම සතුටුදායක බවද, මෙම තනතුර සඳහා තෝරාගත හොත් දැනට දරන තනතුරෙන් ඔහු/ඇය නිදහස් කළ හැක./නොහැකි බවද ප්‍රකාශ කරමි.

________________,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

දිනය:————————,

09-727

---

**පාලින්දනුවර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මාර්ග කම්කරු හා සෞඛ්‍ය කම්කරු තනතුරු සඳහා බඳවා ගැනීමට අයදුම්පත් කැඳවනු ලැබේ.

පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩුවී ඇති පහත සඳහන් තනතුරු පිරවීම සඳහා අදාල අවම සුදුසුකම් සපුරා ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචි කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01. | මාර්ග කම්කරු | 01 | ර. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | 8 වැනි ශ්‍රේණිය සමත් වී තිබීම |
| 02. | සෞඛ්‍ය කම්කරු | 02 | රු. 11,730 - 16 x 120 - 10 x 130 - 10 x 145 - 12 x 160 - රු. 17,600 | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*02. අවශ්‍ය වෙනත් සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලාංකික පුරවැසියෙකු විය යුතුය ;
(ii) විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතුය;
(iii) අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය ;
(iv) දැනටමත් මෙම සභාවේ අදාළ තනතුරුවල තාවකාලික/අනියම්/ආදේශක/දීමනා පදනමින් සේවයේ නියුක්ත වූවන්ට වැඩි සැළකිල්ලක් දක්වනු ලැබේ.

විධිමත් සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු ය -

1. උප්පැන්න සහතිකය;
2. අධ්‍යාපන සහතික ;
3. පදිංචිය සනාථ කිරීමේ සහතික ;
4. මෑතකදී ලබාගත් චරිත සහතිකයක් ;

අයදුම්කරුවන් මෙහි දක්වා ඇති පරිදි ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කර ගන්නා ලද අයදුම්පත් 2012.10.10 වැනි දිනට පෙර ලැබෙන සේ "ලේකම්, පාලින්දනුවර ප්‍රාදේශීය සභාව" යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අදාළ තනතුර සඳහන් කර එවිය යුතුය.

ඒ. එන්. පැලවත්ත,
ලේකම්,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාව.

2012ක් වූ අගෝස්තු මස 09 වැනි දින,
පාලින්දනුවර ප්‍රාදේශීය සභාවේ දී ය.

**පාලින්ද නුවර ප්‍රාදේශීය සභාව**

***බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ........................................ තනතුර සඳහා අයදුම්පත්‍රය***

01. මුලකුරු සමග නම :——————.
මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. ස්ථිර පදිංචි ලිපිනය :——————.

03. ස්ථිර ලිපිනය :——————.

04. විවාහක/අවිවාහක බව:——————.

05. ස්ත්‍රී/පුරුෂ භාවය :____________.

06. උපන් දිනය: අවුරුද්ද :——————. මාසය:——————. දිනය:——————.

07. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින් ද? ලියාපදිංචිවීමෙන් ද? යන වග:——————.

08. අධ්‍යාපන සුදුසුකම් :

අ.පො.ස. (සා.පෙළ) විභාගය .:
සමත් වූ වර්ෂය හා විභාග අංකය:——————.

| *විෂයය* | *සාමාර්ථය* | *විෂයය* | *සාමාර්ථය* |
|---|---|---|---|
| 1. | | 5. | |
| 2. | | 6. | |
| 3. | | 7. | |
| 4. | | 8. | |

වෙනත් සුදුසුකම් :-

09. වෘත්තීය සුදුසුකම් : ——————.

10. සේවා පළපුරුද්ද : ——————.
(i) දැනට සේවය කරන ආයතනය: ——————.
(ii) දැනට දරන තනතුර: ——————.
(iii) එම තනතුරට පත්වූ දිනය: ——————.
(iv) පෙර සේවය කරන ස්ථානයේ දරන ලද තනතුර : ——————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇතොත් තෝරා ගැනීමෙන් පසුව වුව තනතුර අවලංගු කළ හැකි බවත් තෝරා ගැනීමෙන් පසුව ඒ බව හෙළි වුවහොත් සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

____________
අයදුම්කරුගේ අත්සන.

*දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන ...................................... මයා./මිය./මෙනවිය මෙම ආයතනයේ ............................................. වශයෙන් සේවය කරයි. ඇය/ඔහු සේවයෙන් නිදහස් කළ හැකිය./නොහැකිය. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ නිත්‍යානුකූල දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

___________.
ආයතන ප්‍රධානියා.

නම :———————.
පදවි නාමය :———————.
දෙපාර්තමේන්තුව/ආයතනය :———————.

09-726

---

## නුවරඑළිය ප්‍රාදේශීය සභාව

නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරු සඳහා බඳවා ගැනීමට සුදුසුකම් ඇති අයදුම්කරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ :

| *අනු අංකය* | *තනතුරු නාමය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් කේත අංකය* | *වැටුප් පරිමානය* | *අධ්‍යාපන හා වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | කාර්යාල කාර්ය සහායක | 1 | PL1 2006 (A) | රු. 11,730-10x 120 - 10 x 130- 10 x 145- 10 x 160 - රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො.ස. (සා.පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග සමග අවම වශයෙන් විෂයයන් 06 කින් සාමාර්ථ ලබා තිබිය යුතුය. |
| 02 | මුරකරු | 1 | PL 1 2006 (A) | රු.11,730- 10 x 120 - 10 x 130- 10 x 145 - 10 x 160 - රු.17,600 | අටවන (08) ශ්‍රේණිය සමත්වී තිබීම |
| 03 | ජල කම්කරු | 1 | PL 1 2006 (A) | රු. 11,730 - 10 x 120 - 10 x 130 - 10 x 145 - 10 x 160 - රු. 17,600 | අටවන (08) ශ්‍රේණිය සමත්වී තිබීම |
| 04. | සෞඛ්‍ය කම්කරු | 3 | PL 1 2006 (A) | රු. 11,730 - 10 x120 - 10 x 130 -10 x145 - 10 x 160 - රු. 17,600 | අටවන (08) ශ්‍රේණිය සමත්වී තිබීම |

*පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු පරම්පරාවෙන් හෝ ලියාපදිංචි වීමෙන් ශ්‍රී ලංකා පුරවැසියෙක් විය යුතු ය.
(ii) අයදුම්කරු නුවරඑළිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ අනුගාමී වසර 03 ක ස්ථිර පදිංචියක් ඇති අයෙකු විය යුතු ය. (ඡන්ද හිමි නාමලේඛනයෙන් හෝ ප්‍රදේශීය ලේකම් නිකුත් කරනු ලබන සහතිකයකින් පදිංචිය සනාථ කළ යුතුය.) (නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/ කොන්ත්‍රාත් /ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන අයදුම්කරුවන්ට පමණක් නුවරඑළිය ප්‍රාදේශීය සභා ප්‍රදේශයේ පදිංචිවීම අනිවාර්ය නොවේ.)
(iii) නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ දැනට ස්ථිර/අනියම්/ආදේශක/තාවකාලික/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත සේවය කරන සේවකයින් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙනු ලැබේ.
(iv) යහපත් චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(v) ඉල්ලුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18 ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතුයි. (දැනට සේවයේ නියුක්ත අයට උපරිම වයස් සීමාව බල නොපැවැත්වේ. එහෙත් එම තනතුරට බඳවා ගන්නා දිනට උපරිම වයස ඉක්මවා නොතිබිය යුතුයි.
(vi) අයදුම්කරු දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියක වරදකරුවෙකු කරනු ලැබූවෙකු හෝ පළාත් රාජ්‍ය සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.
(vii) සේවා අවශ්‍යතාවය මත විධිමත් සම්මුඛ පරීක්ෂණයකින් සුදුස්සන් තෝරාගනු ලබයි.
(viii) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයකින් පසුව තෝරාගනු ලැබේ.
(ii) නියමිත සුදුසුකම් සපුරා ඇති අය පමණක් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු අරමුදලට දායකත්වය හිමිවේ.
(iii) පත්වීම අවුරුදු 03 ක පරිවාස කාලයකට යටත්වන අතර, වසර තුන (03) අවසානයේ වැඩ, පැමිණීම හා හැසිරීම යහපත් තත්ත්වයේ සිටින සේවකයින්ට පමණක් ස්ථිර පත්වීම් ප්‍රදානය කරනු ලැබේ.
(vi) මෙම බඳවා ගැනීම ශ්‍රී ලංකා ජනරජයේ ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට ද, මුදල් රෙගුලාසිවලට ද, දෙපාර්තමේන්තු නියෝගවලට ද රජයේ හෝ මධ්‍යම පළාත් සභාව විසින් වරින් වර නිකුත් කරනු ලබන වෙනත් රෙගුලාසි හා නියෝගවලට ද, අනුකූලව ක්‍රියාකිරීමට සියලුම සේවකයින් බැඳී සිටිය යුතු ය.

*ඉල්ලුම්කළ යුතු ආකාරය :*

අයදුම්කරු මෙහි දක්වා ඇති ආදර්ශ අයදුම්පත අනුව ඒ4 ප්‍රමාණයේ කඩදාසියක පිළියෙල කරන ලද අයදුම්පතක් 2012.10.22 දිනට හෝ ඊට පෙර ලැබෙන සේ “ලේකම්, නුවරඑළිය ප්‍රාදේශීය සභාව, කොටගල” යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුයි. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරනු ලබන තනතුර "..... " යන්න සඳහන් කළ යුතුයි. අසම්පූර්ණ අයදුම්පත් ප්‍රතික්ෂේප කරන අතර, නියමිත දිනට පසුව ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ. අයදුම්පත් කැඳවීමෙන් පසුව හෝ කැඳවන අතරතුර දී මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීමේ පූර්ණ බලතල නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතු ය.

අයදුම්පත සමග පහත සහතිකවල පිටපත් ඇමිණිය යුතු අතර, මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේදී ඉදිරිපත් කළ යුතු ය.

(i) උප්පැන්න සහතිකය
(ii) අධ්‍යාපන සහතික
(iii) පදිංචිය සහතික කිරීම පිණිස මෑතක දී ලබාගත් ග්‍රාම නිලධාරි සහතිකය (ප්‍රාදේශීය ලේකම් අනු අත්සන් කර තිබිය යුතුය)
(iv) මෑතකදී ලබාගත් චරිත සහතික 02 ක්
(v) පළපුරුද්ද පිළිබඳ සහතික
(vi) නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා සහතිකයක්

පෙරුමාල් ප්‍රදීප්,
ලේකම්,
නුවරඑළිය ප්‍රාදේශීය සභා කාර්යාලය.

2012 ඔක්තෝබර් මස 01 වැනි දින,
නුවරඑළිය ප්‍රාදේශීය සභාව,
කොටගල.

ආදර්ශ අයදුම්පත්‍රය

**............................................ තනතුර සඳහා අයදුම්පත්‍රය**

1. අයදුම්කරුගේ නම (මුලකුරු සමග) :——————————,
2. මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,
3. තැපැල් ලිපිනය:——————————,
4. දුරකථන අංකය:——————————,
5. උපන් දිනය : වර්ෂය:——————————, මාසය:——————————, දිනය:——————————,
6. ජාතික හැඳුනුම්පත් අංකය:——————————,
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————,මාස:——————————, දින:——————————,
8. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————,
9. විවාහක/අවිවාහක බව:——————————,
10. ජාතිය:——————————,
11. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචිවීමෙන් ද යන වග:——————————,
12. අධ්‍යාපන සුදුසුකම්:——————————,
13. පළපුරුද්ද හා වෘත්තීය සුදුසුකම්:——————————,

14. ඔබ දැනටමත් නුවරඑළිය ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම්
   (i) දැනට දරන තනතුර :————————,
   (ii) එම තනතුරට පත් වූ දිනය:————————,
   (iii) එම පත්වීමේ ස්වභාවය (ස්ථිර/අනියම්/තාවකාලික/ආදේශක/කොන්ත්‍රාත්/ඇස්තමේන්තුගත පදනම මත ද):————————
15. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේ ද?:————————,

මෙම අයදුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් හා නිවැරදිවූත් ඒවා බව මම මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු කිසිවක් අසත්‍ය හෝ වැරදි බව මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවත් පත්වීම ලැබීමෙන් පසු එවැනි කරුණක් ඔප්පු වුවහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවත් දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන

දිනය:————————,

*දැනට රාජ්‍ය සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු/කාරිය වන................................ මහතා/මහත්මිය/මෙනෙවිය මෙම ආයතනයේ......................................... වශයෙන් සේවයේ නියුක්තව සිටී. මෙම තනතුර සඳහා තෝරා ගතහොත් ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැකි/නොහැකි බවත්, ඔහු/ඇය කුමන ආකාරයක හෝ දඬුවමකට භාජනය වී නොමැති බව මින් සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි.

————————,
ආයතන ප්‍රධානියාගේ අත්සන.

නම:————————,
තනතුර:————————,
නිල මුද්‍රාව:————————,

09-728

---

**මහර ප්‍රාදේශීය සභාව**

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මහර ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරට බඳවා ගැනීම සඳහා බස්නාහිර පළාත තුළ පදිංචි සුදුසුකම් ඇති අයගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

| *අනු අංකය* | *තනතුර* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් පරිමානය (මාසිකව)* | *අධ්‍යාපන සුදුසුකම්* |
|---|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | 01 | රු. 11,730-10x120 - 10 x 130-10 x 145-12 x 160 -රු.17,600 (PL 1-2006A) 4 වැනි වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉමකි. | 5 වැනි ශ්‍රේණිය/6 වසර සමත් වී තිබිය යුතුය. |

*බඳවා ගැනීම සඳහා පොදු කොන්දේසි :*

(i) අයදුම්කරුවන් ශ්‍රී ලංකාවේ පුරවැසියන් විය යුතු ය.
(ii) අයදුම්කරු අයදුම්පත් භාරගන්නා අවසන් දිනට පූර්වාසන්නයේ වසර 03ක කාලයක් බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවෙකු විය යුතු ය.
(iii) අයදුම්පත් භාරගන්නා දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45 ට නොවැඩි විය යුතු ය . (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් කාණ්ඩය බලනොපානු ඇත.)
(iv) අයදුම්කරු මනා සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු කරනු ලබූවෙකු හෝ රජයේ හෝ පළාත් පාලන සේවයෙන් පහකරනු ලැබූවෙකු නොවිය යුතු ය.

(vi) අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම මහර ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවයේ නියුක්ත කිරීමේ කොන්දේසි :*

(i) මෙම තනතුර ස්ථිරය හා විශ්‍රාම වැටුප් සහිතය.
(ii) පත්වීමේ දින සිට අවුරුදු තුනක පරිවාස කාලයකට යටත්වේ.
(iii) වැන්දඹු හා වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතු ය.
(vi) මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ජනරජයේ නියෝගවලටද, බස්නාහිර පළාත් සභාව හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ මහර ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතු ය.

*බඳවා ගැනීමේ ක්‍රමය :*

(i) ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මගින් සුදුස්සන් තෝරාගැනේ.
(ii) අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල පිටපත් අමුණා එවිය යුතු අතර මුල් පිටපත් සම්මුඛ පරීක්ෂණයේ දී ඉදිරිපත් කළ යුතු ය.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලි වල සහතික කල පිටපත් එවිය යුතුයි.

(i) උප්පැන්න සහතිකය;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) පදිංචිය සනාථ කිරීමේ සහතිකය;
(iv) මෑතකදී ලබාගත් ග්‍රාම සේවා සහතිකය;
(v) මෑතකදී ලබාගත් චරිත සහතික 02ක්;
(vi) වෙනත් සුදුසුකම් දැක්වෙන සහතික ;
(vii) සේවා පළපුරුද්ද පිළිබඳ සහතික.

අයදුම්පත් ඉදිරිපත් කිරීම

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12''x 8'' ප්‍රමාණයේ අයදුම්පත් සකස් කර ඉල්ලුම් කරන තනතුර අදාළ කවරයේ වම්පස ලියා 2012.10.31 වැනි දිනට පෙර ලේකම්, මහර ප්‍රාදේශීය සභාව, පහළකරගහමුණ, කඩවත යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතු ය.) නියමිත දිනෙන් පසු ලැබෙන ඉල්ලුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

එස්. ඒ. කේ. එන්. ඉන්ද්‍රජිත්,
ලේකම්,
මහර ප්‍රාදේශීය සභාව.

2012 ක්වූ සැප්තැම්බර් මස 05 වැනි දින,
මහර ප්‍රාදේශීය සභාව,
පහළකරගහමුණ,
කඩවත.

ආදර්ශ අයදුම්පත්‍රය

මහර ප්‍රාදේශීය සභාව

*බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ ............................... තනතුර සඳහා බඳවා ගැනීම*

1. මුලකුරු සමග නම :————————.
   මුලකුරුවලින් හැඳින්වෙන නම් :————————.
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය:————————.
3. ස්ථිර ලිපිනය :————————.
4. ස්ත්‍රී/පුරුෂ භාවය :————————.
5. උපන් දිනය : 2012.10.15 දිනට වයස : අවුරුදු :————————,මාස:————————, දින:————————.
6. ජාතික හැඳුනුම්පත් අංකය:————————.

7. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙක් ද? එසේ නම් පරම්පරාවෙන්ද? ලියාපදිංචිවීමෙන් ද යන වග:——————————.

8. (i) අධ්‍යාපන සුදුසුකම්:——————————.

| විෂයය | සාමාර්ථය | විෂයය | සාමාර්ථය |
|---|---|---|---|
| | | | |

(ii) වෙනත් සුදුසුකම්:——————————.

9. වෘත්තීයමය සුදුසුකම්:——————————.

10. සේවා පළපුරුද්ද :-

(i) දැනට දරන තනතුර :——————————.

(ii) එම තනතුරට පත් වූ දිනය:——————————.

(iii) එම තනතුරේ සේවා කාලය:——————————.

(iv) මීට පෙර සේවය කරන ලද ස්ථාන හා දරන ලද තනතුරු :——————————.

මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳව කොන්දේසි අනුව ම විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බව මා තෝරා ගැනීමට පෙර හෝ පසුව හෙළිවුවහොත් මා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දන්වමි.

——————————.

අයදුම්කරුගේ අත්සන

දිනය:——————————.

*දැනටමත් සේවයේ නියුක්තව සිටින අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය*

මෙම ඉල්ලුම්කරු වන............................ මහතා/මහත්මිය/මෙනවිය මෙම කාර්යාලයේ .......................................... වශයෙන් සේවය කරයි.. අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි./නොකරමි.

——————————.

ආයතන ප්‍රධානියාගේ අත්සන.

(නිල මුද්‍රාව)

නම:——————————.

තනතුර:——————————.

නිල මුද්‍රාව:——————————.

09-844

---

**බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

මිනුවන්ගොඩ නගර සභාව

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා නියමිත සුදුසුකම් ඇති බස්නාහිර පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

2. මිනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ මිනුවන්ගොඩ නගර සභා බල ප්‍රදේශයේ ස්ථිර පදිංචිය ඇති හා මෙම සභාවේ දැනටමත් අනියම්/ආදේශක සේවයේ යෙදී ඇති අය පිළිබඳව විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.

| අනු අංකය | තනතුරු නාමය | තනතුරු සංඛ්‍යාව | වැටුප් කේත අංකය | වැටුප් පරිමානය | අධ්‍යාපන හා වෙනත් සුදුසුකම් |
|---|---|---|---|---|---|
| 01 | රියදුරු III "ආ" | 01 | PL3 2006 (A) | රු. 12,470-10x 130 - 10 x 145- 10 x 160- 12 x 170 -රු.18,860<br><br>(හතර වන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | 1. අවම වශයෙන් අටවැනි ශ්‍රේණිය නවය වසර සමත් විය යුතු ය.<br><br>2. තාර බර හොණ්ඩර 24ට අඩු ස්ටේෂන් වැගන් රථ පැදවීම පිළිබඳ හෝ ඊට වැඩි බර පන්තියක වාහන පැදවීම පිළිබඳව මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද සහතිකයක් ලබා තිබීම.<br><br>3. වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතු ය.<br><br>4. දිවා රාත්‍රී සේවයේ යොදන බැවින් ශාරීරික වශයෙන් සුදුසු විය යුතු අතර මනා ඇස් පෙනීමක් තිබිය යුතු ය.<br><br>5. මහා මාර්ග නීති සංග්‍රහය පිළිබඳ දැනුමක් තිබිය යුතු ය. |
| 02 | මාර්ග කම්කරු (කා.සේ..සේ.III) | 04 | PLI 2006 (A) | රු.11,730- 120 x 10 - 130 x 10- 145 x 10 - 160 x 12 - රු.17,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | 5 වැනි ශ්‍රේණිය සමත්ව තිබිය යුතු ය. |
| 03 | සෞඛ්‍ය කම්කරු (කා.සේ..සේ.III) | 01 | PL I 2006 (A) | රු.11,730- 120 x 10 - 130 x 10- 145 x 10 - 160 x 12 - රු.17,600 (හතරවන වැටුප් පියවරට එළඹීමට පෙර කාර්යක්ෂමතා කඩඉම) | අධ්‍යාපන සුදුසුකම් සලකා බලනු නොලැබේ. |

*02. පොදු සුදුසුකම් :*

(i) අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙක් විය යුතු ය.
(ii) යහපත් චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්වයකින් යුක්ත විය යුතු ය.
(iii) අයදුම්පත් කැඳවන දිනට පෙරාතුව බස්නාහිර පළාතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ අවම වශයෙන් වසර 03ක ස්ථිර පදිංචියක් තිබිය යුතු ය.
(iv) අයදුම්පත් කැඳවන අවසන් දිනට වයස අවුරුදු 18ට නොඅඩු හා 45ට නොවැඩි විය යුතුය. දැනටමත් රාජ්‍ය /පළාත් රාජ්‍ය සේවයේ නියුක්ත වූවන් සඳහා උපරිම වයස බලපානු නොලැබේ.
(v) දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් දඬුවම් ලැබූවෙකු නොවිය යුතු ය.

*03. බඳවා ගැනීම හා සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :-*

(i) මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය.
(ii) වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.
(iii) බඳවා ගනු ලබන තැනැත්තන් තුන් අවුරුදු පරිවාස කාලයකට යටත්වේ.
(iv) සම්මුඛ පරීක්ෂණය සඳහා සහභාගී වන අයදුම්කරුවන්ගේ අධ්‍යාපන සුදුසුකම් හා වාචික පරීක්ෂණයේ ප්‍රතිඵල මත බඳවා ගැනීම කරනු ලැබේ.

*4. සේවා කොන්දේසි :*

පත්වීම ලබන්නන් ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ කොන්දේසිවලට ද, බස්නාහිර පළාත් සභාවේ මුදල් රෙගුලාසිවලටද, බස්නාහිර පළාත් රෙගුලාසි හෝ බස්නාහිර පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හෝ මිනුවන්ගොඩ නගර සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලටද, අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

*5. අයදුම්පත් ඉදිරිපත් කිරීම :*

ඉහත සුදුසුකම් සපුරාලන අයදුම්කරුවන් විසින් සකස් කර එවනු ලබන අයදුම්පත් මේ සමග ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව 2012.10.25 වැනි දිනට හෝ ඊට පෙර ලැබෙන සේ "ලේකම්, නගර සභාව, මිනුවන්ගොඩ " යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. තව ද අයදුම්පත්‍රය බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ අයදුම්කරන තනතුර සඳහන් කළ යුතුය. ප්‍රමාද වී එවනු ලබන අයදුම්පත් සහ අසම්පූර්ණ අයදුම්පත් සම්බන්ධව සලකා බලනු නොලැබේ.

අයදුම්පත්‍රය සමග සුදුසුකම් සනාථ කිරීම සඳහා අදාල පහත සඳහන් සහතික පිටපත් අමුණා එවිය යුතුය :-

(i) උප්පැන්න සහතිකය ;
(ii) අධ්‍යාපන සහතිකය;
(iii) ග්‍රාම නිලධාරී සහතිකය ;
(iv) පළපුරුද්ද පිළිබඳ සහතිකය;
(v) චරිත සහතික දෙකක්.

මෙම අයදුම්පත්‍ර කැඳවීමේදී හෝ කැඳවන අතරතුර හෝ බඳවා ගැනීම හෝ බඳවා නොගැනීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීමේ හෝ සංශෝධනය කිරීමේ සියළු බලතල මිනුවන්ගොඩ නගර සභාවේ ලේකම් සතු වේ.

එච්. ඒ. එස්. රත්නලතා,
ලේකම්,
නගර සභාව, මිනුවන්ගොඩ.

2012 අගෝස්තු මස 30 වැනි දින,
මිනුවන්ගොඩ නගර සභාවේ දී ය.

ආදර්ශ අයදුම්පත්‍රය

බස්නාහිර පළාත් රාජ්‍ය සේවයේ මිනුවන්ගොඩ නගර සභාවේ ............................................ තනතුරු සඳහා ආදර්ශ අයදුම්පත්‍රය

1. (i) මුලකුරු සමග නම :——————————,
(ii) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————————,
2. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :——————————,
3. ස්ථිර ලිපිනය :——————————,
4. ජාතික හැඳුනුම්පත් අංකය:——————————,
5. ස්ත්‍රී/පුරුෂ භාවය:——————————,
6. උපන් දිනය : වර්ෂය:——————————, මාසය:——————————, දිනය:——————————,
7. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු :——————————,මාස:——————————, දින:——————————,
8. විවාහක/අවිවාහක බව:——————————,
9. ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචිවීමෙන් ද ? :——————————,
10. අධ්‍යාපන සුදුසුකම්( සහතිකවල පිටපත් ඇමිනිය යුතුය) :——————————,
11. රියදුරු බලපත්‍රයේ වර්ගය සහ අංකය (රියදුරු තනතුර සඳහා අදාල වේ) :——————————,
12. (i) වෙනත් සුදුසුකම් :——————————,
(ii) වෘත්තීය සුදුසුකම් :——————————,
(iii) සේවා පළපුරුද්ද :——————————,
13. ඔබ දැනටමත් මෙම නගර සභාවේ සේවයේ නියුක්තව සිටින්නේ නම් දැනට දරන තනතුර ස්ථිර/අනියම්/තාවකාලික/කොන්ත්‍රාත්/ ආදේශක ද යන වග:——————————,
එම තනතුරට පත් වූ දිනය :——————————,
14. ඔබ කවරදාක හෝ උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ? :——————————,

මෙම අයදුම්පතෙහි මා විසින් සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත් කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහකරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

————————,
අයදුම්කරුගේ අත්සන.

දිනය:——————————.

09-990

---

**පානදුර ප්‍රාදේශීය සභාව**

සංශෝධනය කිරීමයි

අංක 1775 දරන 2012.09.07 දින IV(ආ) වැනි කොටස පළාත් පාලන ගැසට් පත්‍රයේ පුරප්පාඩු සඳහා ඉල්ලුම්පත් කැඳවන අවසාන දිනය 2012.10.15 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් කාරුණිකව දන්වා සිටිමි.

ලේකම්,
පානදුර ප්‍රාදේශීය සභාව,
වාද්දුව.

09-1220

---

# පළාත් පාලන නිවේදන

**නියාගම ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ සම්මත අතුරු ව්‍යවස්ථා වැළඳ ගැනීම**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 හා 126 දක්වා වූ වගන්ති වලින් 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2(3) වගන්තියෙන් පනවා ගැනීමට ප්‍රාදේශීය සභාවලට ලැබී ඇති බලතල ප්‍රකාර බලය ලැබෙන්නා වූ ද 1952 අංක 06 දරන පළාත් පාලන ආයතන (සම්මත අතුරු ව්‍යවස්ථා) පනතේ 2 වැනි වගන්තියෙන් පළාත් පාලන අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල ද අනුව ඔහු විසින් සම්පාදන කර අංක 520/7 හා 1988.08.23 දින දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද දකුණු පළාත් සභාව විසින් අනුමත කර ඒ බව අංක 648 හා 1991.02.01වැනි දින දරන *ගැසට් පත්‍රයේ* නිවේදනයක් මගින් පිළිගනු ලැබුවාවූ ද,සම්මත අතුරු ව්‍යවස්ථා 01 සිට 42 දක්වා කාණ්ඩ මෙම නිවේදනය *ගැසට් පත්‍රයේ* පළවන දින සිට වලංගු වන සේ පිළිගැනීමට නියාගම ප්‍රාදේශීය සභාවේ 2012 ජූලි මස 24 වැනි දින පැවැත්වූ සභා රැස්වීමේදී සම්මත වූ යෝජනාවක් මගින් තීරණය වී ඇති බව මෙයින් නිවේදනය කරමි.

ප්‍රසාද් වීරක්කොඩි,
සභාපති,
ප්‍රාදේශීය සභාව,
නියාගම.

2012 ජූලි මස 24 වැනි දින,
නියාගම ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

09-1141

---

**අගලවත්ත ප්‍රාදේශීය සභාව**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (අ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර බස්නාහිර පළාත් සභාවේ කළුතර දිස්ත්‍රික්කයේ අගලවත්ත ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මංමාවත් වලට අදාල ඉඩම් වල අයිතිකරුවන් ලෙස හිමිකම්පාන පාර්ශවයන් විසින් හෝ යම් විරුද්ධත්වයක් පළ කරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දින සිට එක් මසක් ඇතුලත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙසට මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාල සීමාව තුළ යම් විරුද්ධත්වයක් ඉදිරිපත් නොවුනහොත් උපලේඛනයේ සඳහන් මංමාවත් අගලවත්ත ප්‍රාදේශීය සභාව සතු මංමාවත් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් ජනතාවගේ දැන ගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

චාමින්ද රණවක,
සභාපති,
අගලවත්ත ප්‍රාදේශීය සභාව.

2012 සැප්තැම්බර් මස 11 වැනි දින,
අගලවත්ත ප්‍රාදේශීය සභාවේ දී ය.

| *අනු අංකය* | *මාර්ගය* | *දිග කි. මී.* | *පළල මී.* |
|---|---|---|---|
| 01 | උඩවෙල හැළඹ මාර්ගයේ ගමගොඩ කන්ද මුදුනින් වම් පසින් සුනිල් ජයන්ත මහතාගේ නිවස අසලින් අවසන් වන වල්ගමයාවත්ත පාර | 0.11 | 4.87 |
| 02 | උඩවෙල හැළඹ මාර්ගයෙන් ආරම්භ වන එම්. ඒ. ගුණදාස මහතාගේ නිවස අසලින් අවසන් වන හැළඹ ගිල්බහේන පාර | 0.12 | 4.87 |
| 03 | අගලවත්ත මතුගම මාර්ගයේ තිලක ලී මෝල අසලින් ආරම්භ වන නීල් මහතාගේ නිවස අසලින් අවසන් වන පැලැඳයාගේවත්ත පාර | 0.185 | 4.87 |
| 04 | අගලවත්ත ඩාර්ටන්ෆීල්ඩ් මාර්ගයේ වඳුරබ්බ හන්දියෙන් ආරම්භ වී දොලහේන රිදීරේබාගම හන්දියෙන් අවසන් වන මුලටියන්ගොඩ රිදීරේබාගම පාර | 1.5 | 4.87 |
| 05 | රේස්වත්ත මාර්ගයෙන් ආරම්භ වී මාටින්වත්ත මාර්ගයෙන් අවසන් වන රේස්වත්ත පළමු පටුමග | 0.11 | 3.65 |
| 06 | රේස්වත්ත මාර්ගයෙන් ආරම්භ වී කොඩිතුවක්කු මහතාගේ නිවස අසලින් අවසන් වන රෙස්වත්ත දෙවෙනි පටුමග | 0.075 | 3.65 |
| 07 | අගලවත්ත මතුගම ප්‍රධාන පාරෙන් ආරම්භ වී උඩවෙල මාර්ගයෙන් අවසන් වන රේස්වත්ත වෙන්දේසි ඉඩම මාර්ගය | 0.4 | 4.57 |
| 08 | පොල්ගම්පල කුරුපිට මාර්ගයෙන් ආරම්භ වී ඩී. වී. ඩී. සමරසිංහ මහතාගේ නිවස අසලින් අවසන් වන වරලත්පිටිය වැරැල්ලවත්ත පාර | 0.085 | 3.05 |
| 09 | දියපත්තුගම සූරියගොඩ මාර්ගයෙන් ආරම්භ වන ජී. ඩී. සුනිල් මහතාගේ නිවස අසලින් අවසන් වන මුත්තෙට්ටුවහේනකන්ද පාර | 0.5 | 3.65 |

09-1249

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.